# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


## 2026 ඔක්තෝබර් මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.10.13 දින නිකුත් කරන ලදී)


**ප්‍රජා පාදක විශෝධන (සංශෝධන)**

**1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

**2 වන වගන්තිය** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, එමගින්, ඒ පනතේ විෂය පථය පුළුල් කරමින් එහි දීර්ඝ නාමයට අනෙකුත් නිලධරයන් පත් කිරීම ඇතුළත් කරනු ලැබේ.

**3 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ ශීර්ෂය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**4 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රජා විශෝධන නිලධරයන් පත් කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**5 වන වගන්තිය** : මේ වගන්තිය මගින් 3 වන වගන්තියේ කාර්ය සඳහා ප්‍රජා විශෝධන නිලධරයන් ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සහ එහි පැති සටහන සංශෝධනය කරනු ලැබේ.

**6 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එයට ප්‍රජා විශෝධන නිලධරයන් ඇතුළත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, එමගින් 4 වන වගන්තිය යටතේ වන කොමසාරිස්වරයාගේ පාලනය ප්‍රජා විශෝධන නිලධරයන් දක්වා ද දීර්ඝ කරනු ලැබේ.

**7 වන වගන්තිය** : පරීක්ෂණ සහ විමර්ශන පැවැත්වීමේ කාර්ය සඳහා කොමසාරිස්වරයාගේ අධිකාරි බලය යටතේ නිලධරයන් විසින් පමණක් ක්‍රියා කරනු ලැබිය හැකි බවට නිශ්චිතව දක්වමින් මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**8 වන වගන්තිය** : ප්‍රජා පාදක විශෝධන ආඥාව සම්බන්ධයෙන් වරදකරු දැනුම්වත් කිරීම සඳහා ප්‍රජා විශෝධන නිලධරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා සහ ඒ සඳහා තමා කැමැත්ත දක්වන්නේ ද යන්න පෙන්වාදීම සඳහා අධිකරණය විසින් වරදකරු වෙත පැය හතලිස්අටක කාලසීමාවක් ලබාදීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**9 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

**10 වන වගන්තිය** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට අනුෂංගික වේ.

**11 වන වගන්තිය** : මේ වගන්තිය මගින් දඩ මුදල රුපියල් පන්දහසේ සිට රුපියල් විසිපන්දහස දක්වා වැඩි කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

**12 වන වගන්තිය** : තත්කාලයේ බලපවත්නා දඩ සීමාව වැඩි කිරීමේ අරමුණින් යුතුව මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී. - ඕ 22/2025

## 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක  දරන ප්‍රජා පාදක විශෝධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1999 අංක 46 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතේ දීර්ඝ නාමය, එහි ‘‘ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයකු පත් කිරීම සඳහා ද,’’ යන වචන වෙනුවට ‘‘ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයකු සහ අනෙකුත් නිලධරයන් පත් කිරීම සඳහා ද;’’ යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ 2 වන වගන්තියට පෙරාතුව ම ඇති ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

> ‘‘ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයා සහ අනෙකුත් නිලධරයන්’’.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ ‘‘නියෝජ්‍ය කොමසාරිස්වරයන් හා සහකාර කොමසාරිස්වරයන් ද,’’ යන වචන වෙනුවට ‘‘නියෝජ්‍ය කොමසාරිස්වරයන්, සහකාර කොමසාරිස්වරයන් සහ ප්‍රජා විශෝධන නිලධරයන් ද,’’ යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

PL 15960 - 465 (2026/10)

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "සෑම ප්‍රජා පාදක විශෝධන නියෝජ්‍ය කොමසාරිස්වරයකු හා සෑම ප්‍රජා පාදක සහකාර කොමසාරිස්වරයකුම" යන වචන වෙනුවට "සෑම ප්‍රජා පාදක විශෝධන නියෝජ්‍ය කොමසාරිස්වරයකු ම, ප්‍රජා පාදක විශෝධන සහකාර කොමසාරිස්වරයකු ම සහ ප්‍රජා විශෝධන නිලධරයකු ම" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ "නියෝජ්‍ය කොමසාරිස්වරයන් හා සහකාර කොමසාරිස්වරයන්" යන වචන වෙනුවට "නියෝජ්‍ය කොමසාරිස්වරයන්, සහකාර කොමසාරිස්වරයන් සහ ප්‍රජා විශෝධන නිලධරයන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (අ) වන ඡේදයේ "නියෝජ්‍ය කොමසාරිස්වරයන් හා ප්‍රජා පාදක විශෝධන සහකාර කොමසාරිස්වරයන් විෂයයෙහි ද," යන වචන වෙනුවට "නියෝජ්‍ය කොමසාරිස්වරයන්, ප්‍රජා පාදක විශෝධන සහකාර කොමසාරිස්වරයන් සහ ප්‍රජා පාදක විශෝධන නිලධරයන් විෂයයෙහි ද," යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (5) වන උපවගන්තියේ, "ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට" යන වචන වෙනුවට "ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට" යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තිය යටතේ වන ප්‍රජා පාදක විශෝධන ආඥාවක ප්‍රයෝජන පිළිබඳව වරදකරු දැනුම්වත් කිරීම සඳහා අධිකරණය විසින් ඒ වරදකරු, අධිකරණය වෙත පත් කර ඇති ප්‍රජා විශෝධන නිලධරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර ඉන් පසුව ඒ වරදකරු විසින් තමා සම්බන්ධයෙන් එවැනි ආඥාවක් ඇතුළත් කරනු ලැබීමට කැමති වන්නේ ද යන වග අධිකරණය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, අධිකරණය විසින්, සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර වරදකරු ප්‍රජා විශෝධන නිලධරයා වෙත යොමු කරනු ලබන වේලාවේ සිට ආරම්භ වන අඛණ්ඩ පැය හතළිස් අටක කාලසීමාවක් ලබා දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ, (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ "ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයකු" යන වචන වෙනුවට "ප්‍රජා විශෝධන නිලධරයකු හෝ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ, (2) වන උපවගන්තියේ -

(අ) (i) වන අනුඡේදයේ "ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන භාර නිලධරයා" යන වචන වෙනුවට "ප්‍රජා විශෝධන නිලධරයා

හෝ ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන භාර නිලධරයා'' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ii) වන අනුඡේදයේ ''කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයකුගේ'' යන වචන වෙනුවට ''ප්‍රජා විශෝධන නිලධරයකුගේ හෝ කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ නිලධරයකුගේ'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ ''ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා'' යන වචන වෙනුවට ''ප්‍රජා විශෝධන නිලධරයා, කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු හෝ ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය භාර නිලධරයා'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ ''රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට'' යන වචන වෙනුවට ''රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට'' යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

''**උපලේඛනය**

**[9 (3) වන වගන්තිය]**

| | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| | **බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩ මුදලේ ප්‍රමාණය** | **ගෙවීමක් නොලබන ප්‍රජා වැඩ කාලසීමාව** |
| 1. | අවුරුදු එකක් හෝ අවුරුදු එකකට වැඩි කාලයක් | අවුරුදු එකක කාලසීමාවක් තුළ පැය 200 සිට 300 දක්වා |

| | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| | **බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩ මුදලේ ප්‍රමාණය** | **ගෙවීමක් නොලබන ප්‍රජා වැඩ කාලසීමාව** |
| 2. | මාස හයක් හෝ ඊට වැඩි එහෙත් අවුරුදු එකකට වඩා අඩු කාලයක් | මාස හයක කාලසීමාවක් තුළ පැය 100 සිට 200 දක්වා |
| 3. | මාස හයකට අඩු කාලයක් | මාස තුනක කාලසීමාවක් තුළ පැය 50 සිට 100 දක්වා |
| 4. | රුපියල් පනස්දහසක් | අවුරුදු දෙකක කාලසීමාවක් තුළ පැය 200 සිට 300 දක්වා |
| 5. | රුපියල් හතලිස්දහසක් හෝ ඊට වැඩි එහෙත් රුපියල් පනස්දහසට වඩා අඩු මුදලක් | අවුරුදු එකහමාරක කාලසීමාවක් තුළ පැය 150 සිට 200 දක්වා |
| 6. | රුපියල් තිස්දහසක් හෝ ඊට වැඩි එහෙත් රුපියල් හතලිස්දහසට වඩා අඩු මුදලක් | අවුරුදු එකක කාලසීමාවක් තුළ පැය 75 සිට 150 දක්වා |
| 7. | රුපියල් විසිදහසක් හෝ ඊට වැඩි එහෙත් රුපියල් තිස්දහසට වඩා අඩු මුදලක් | මාස හයක කාලසීමාවක් තුළ පැය 50 සිට 75 දක්වා |
| 8. | රුපියල් විසිදහසට වඩා අඩු මුදලක් | මාස තුනක කාලසීමාවක් තුළ පැය 50 සිට 75 දක්වා.”. |

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.